# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1388/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 27/08/2024 පැය 2030

## මාධ්‍ය නිවේදනය

### ක්‍රිකට් තරඟ පාවාදීම හා යෝජනා කිරීම සම්බන්ධයෙන් චූදිතයෙකුට ගරු මහාධිකරණය මඟින් දඬුවම් නියම කිරීම - ක්‍රීඩා වලට සම්බන්ධ වැරදි වැලැක්වීමේ විශේෂ විමර්ශන ඒකකය.

2024 මාර්තු මස 08 වන දින සිට 2024 මාර්තු මස 19 වන දින දක්වා පල්ලේකැලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ පැවති Legend cricket Trophy - 2024 තරඟාවලිය තුල 2019 අංක 24 දරණ ක්‍රීඩා වලට සම්බන්ධ වැරදි වැලැක්වීමේ පනත යටතට ගැනෙන වැරදි සිදු වන බවට ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ දූෂණ විරෝධී ඒකකය මඟින් ක්‍රීඩා වලට සම්බන්ධ වැරදි වැලැක්වීමේ විශේෂ විමර්ශන ඒකකය වෙත කරන ලද පැමිණිල්ලකට අදාලව එම ඒකකය මගින් විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

එම තරඟාවලියේදී පන්ජාබ් රෝයල් කණ්ඩායම වෙනුවෙන් ක්‍රීඩා කළ එංගලන්ත ජාතික ක්‍රීඩකයෙකුට සහ නවසීලන්ත ජාතික ක්‍රීඩකයෙකුට තරඟ පාවාදීමට යෝජනා කර ඇති බවට සිදු කළ විමර්ශනයේදී අනාවරණය වී ඇත. ඒ අනුව මෙම සිද්ධියට අදාලව ඉන්දියානු ජාතිකයෙකු චූදිත වශයෙන් නම් කර තරඟ පාවාදීමට අදාලව හා තරඟ පාවාදීමට යෝජනා කිරීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව විසින් මහනුවර මහාධිකරණයේ අධි චෝදනා ගොනු කර ඇත.

2024.08.27 වන අද දින මහනුවර ගරු මහාධිකරණයේදී මෙම නඩු කැඳවූ අවස්ථාවේදී ඉන්දියානු ජාතිකයා එම අධිචෝදනා දෙක සඳහාම වරද පිළි ගැනීමෙන් පසු ගරු මහාධිකරණ විනිසුරුතුමා විසින් එක් නඩුවකට රුපියල් මිලියන 5.5 බැගින් මිලියන 11 ක්ද , එක් නඩුවකට වසර 02 බැගින් බරපතල වැඩ සහිතව වසර 10 බැගින් අත්හිටවූ සිර දඬුවම් නියම කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**